# මහා පරිනිර්වාණ සූත්‍රය

(දී.නි. II, 110-264 පිට)

බුදුරජාණන් වහන්සේගේ සිව්සාලිස් වසරක උත්තම ජීවිතයෙහි අවසාන වශයෙන් ලොවට දේශනා කළ අනුශාසනා මෙන් ම බුදුරදුන්ගේ අවසාන සමයෙහි සිදු වූ වැදගත් සිදුවීම් රැසක් ඇතුළත් සවිස්තරාත්මක දේශනාව මහා පරිනිර්වාණ සූත්‍රය නමින් හැඳින්වේ. සූත්‍ර පිටකයේ දීඝනිකායට ඇතුළත් ප්‍රමාණයෙන් දීර්ඝ සූත්‍රයක් වන මෙයට පහත සඳහන් කරුණු ප්‍රධාන වශයෙන් ඇතුළත් වේ. ඒවා නම්,

- වජ්ජීන් තුළ පැවැති සප්ත අපරිහානිය ධර්ම
- භික්ෂූන් වහන්සේ තුළ පැවැතිය යුතු විවිධාකාර වූ සප්ත අපරිහානීය ධර්ම
- භික්ෂූන් වහන්සේට දෙසූ දැහැමි කථා
- සාරිපුත්ත මාහිමියන්ගේ සිංහනාදය
- පාටලී ග්‍රාමයෙහි උවසුවන්ට දෙසූ අවවාද
- පාටලී නගර නිර්මාණය
- චතුරාර්ය සත්‍ය ප්‍රතිවේධ කථා
- ධම්මාදාස ධර්ම පර්යාය
- අම්බපාලී වනයෙහි දී දෙසූ සතර සතිපට්ඨාන දේශනාව
- අම්බපාලී පිදූ ආරාමය පිළිගැනීම
- බේලුව ගමෙහි දී ජීවිත සංස්කාර අධිෂ්ඨානය
- චාපාල චෛත්‍යස්ථානයෙහි දී ආයුසංස්කාර හැරලීම
- මහාපෘථිවිය සෙලවීමට බලපාන හේතු අට
- අට පිරිස
- අෂ්ට අභිභායතන හා අෂ්ට විමෝක්ෂ
- මාර ආයාචනය
- ආනන්ද මාහිමියන්ගේ ආයාචනය
- බ්‍රහ්මචර්ය චිරස්ථායී ධර්මදේශනා
- ආර්ය ධර්ම සතර
- සතර මහාපදේශ
- චුන්ද කර්මාරපුත්‍ර කථාව
- ලෝහිත පක්ඛන්දිකා ආබාධය
- ආනන්ද මාහිමියන් බුදුරදුන්ට පැන් ගෙනඒම
- පුක්කුස මල්ලපුත්ත කථාව
- අඹවනයට එළඹීම
- සම ආනිසංස ඇති පිණ්ඩපාත දාන දෙක
- කුසිනාරාවට වැඩමවීම
- උපවාන තෙරුවන් පිළිබඳ කථාව
- ආනන්ද මාහිමියන් ඇසූ ප්‍රශ්න
- ථූපාරහ පුද්ගලයෝ
- ආනන්ද තෙරුන්ගේ ආශ්චර්ය ධර්ම
- මහා සුදස්සන සූත්‍ර දේශනාව
- මල්ල රජදරුවන්ගේ වන්දනාව
- සුභද්‍ර පරිව්‍රාජකයාගේ කථාවස්තුව
- තථාගතයන් වහන්සේගේ අවසාන වචනය
- තථාගත පරිනිර්වාණය
- මහාකාශ්‍යප මාහිමියන්ගේ වැඩමවීම
- ශාරීරික ධාතූන් බෙදීම හා ධාතු චෛත්‍ය පූජාව

මහා පරිනිර්වාණ සූත්‍රය ආරම්භ වන්නේ භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජ්ඣකූට පර්වතයෙහි වැඩ වෙසෙන සමයෙහි ය. එසමයෙහි වේදේහපුත්‍ර වූ මගධාධිපති අජාසත් රජතුමා වජ්ජීන් මැඩලනු සඳහා සැරසුණි. එවිට අජාසත් රජතුමා වස්සකාර නම් තම ප්‍රධාන (බ්‍රාහ්මණ) අමාත්‍යවරයා අමතා යුද්ධයට පෙර බුදුරදුන් මුණගැසීමට යන ලෙස අණ කළේ ය. බුදුරදුන් වෙත ගොස් උන් වහන්සේට ගරුසරු දක්වා උන් වහන්සේගේ සුවදුක් විචාරා තමා වජ්ජීන් හා යුද්ධයට යන බව උන් වහන්සේට පවසන ලෙසත් එවිට උන් වහන්සේ වදාරන වචනය අසා දැන ගෙන එන ලෙසත් අජාසත් රජු වස්සකාර ඇමතියාට දන්වා සිටියේ ය. ඒ අනුව බුදුරදුන් වෙත ගිය වස්සකාර අමාත්‍යයා බුදුරදුන් සමීපයෙහි අජාසත් රජුගේ අදහස් ප්‍රකාශ කළේ ය.

මෙහි දී භාග්‍යවතුන් වහන්සේට පවන් සලමින් සිටි අනඳ තෙරුන් අමතා බුදුරදුන් ප්‍රකාශ කර සිටියේ වජ්ජීන් තුළ පවත්නා අපරිහානීය ධර්ම හත පිළිබඳවයි. ඒ අනුව,

ආනන්ද, 1. වජ්ජි රජවරු නිතර (දවසට තෙවරක්) රැස් වෙති. ඔවුන් මෙලෙස නිතර එක් රැස්වන තාක් ඔවුන්ගේ පිරිහීමක් නොවන බව සඳහන් කළහ. 2. වජ්ජි රජවරු සමගිව රැස්වෙති. සමගිව නැගිට යති. සමගිව කටයුතු කරති. 3. වජ්ජි රජවරු පෙර නොපැනවූවක් නොපනවති. පැනවූ දෑ නොසිඳති. පනවන ලද පුරාණ දහම්හි පිහිටා සිටිත්. 4. වජ්ජීහු සිය පරපුරේ මහලු අයට සත්කාර සම්මාන කරති. ඔවුන්ගේ බසට ඇහුම්කම් දෙති. 5. වජ්ජීහු කුල කාන්තාවන් කුල කුමාරිකාවන් බලහත්කාරයෙන් තමන් වෙත රඳවා නොගනිති. 6. වජ්ජීහු තමන්ගේ පූජනීය ස්ථානවලට ගරුසරු දක්වති. ඒවාට දැහැමි පුදපඬුරු දෙති. 7. වජ්ජීහු තම රටට පැමිණෙන රහතුන්ට ආරක්ෂාව, පහසුකම් සලසති. වජ්ජීන් තුළ පවත්නා මෙකී ගුණාංග පවත්නා තාක් ඔවුන් නොපිරිහෙන බව භාග්‍යවතුන් වහන්සේ අනඳ මාහිමියන්ට සඳහන් කළහ.

ඉන්පසු බුදුරජාණන් වහන්සේ වස්සකාර ඇමතියා අමතා ***'බමුණ, එක් සමයෙක මම විසල්පුර සාරන්දද චෛත්‍යයෙහි විසීමි. එහි දී මම වජ්ජීන්ට මෙම අපරිහානීය ධර්ම දෙසුවෙමි. යම්තාක් කල් මෙම අපරිහානිය ධර්ම වජ්ජීන් තුළ පවතිද්ද ඒතාක් ඔවුන්ගේ දියුණුවක් මිස පරිහානියක් සිදුනොවේ'*** යැයි සඳහන් කළහ. එවිට වස්සකාර බමුණා ප්‍රකාශ කළේ ***'මෙම එක් එක් අපරිහානිය දහමකින් වුව ද වජ්ජීන්ගේ දියුණුවක් ම වන බවයි. මෙම දහම් හත ම ඇති කල්හි කියනුම කවරේ ද'*** යනුවෙනි. මෙම අපරිහානිය ධර්ම වජ්ජීන් තුළ පවත්නා තාක් ඔවුන් මැඩලිය නොහැකි බව පවසා බුදුරදුන්ට සමු දී වස්සකාර ඇමැතියා පිටත් ව ගියේ ය.

වස්සකාර බමුණා පිටත් ව ගිය පසු බුදුරජාණන් වහන්සේ අනඳ මාහිමියන් කැඳවා සියලු භික්ෂු සංඝයා රැස් කරන ලෙස දන්වා සිටියහ. ඒ අනුව සියලු භික්ෂූන් රැස්වූ කල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් තුළ පැවැතිය යුතු **අපරිහානිය ධර්ම හතක්** සඳහන් කළහ. ඒවා නම්

1. යම්තාක් භික්ෂූහු නිතර රැස් වෙත් ද එමගින් භික්ෂූන්ගේ යහපතක් ම සිදු වේ. පිරිහීමක් සිදු නොවේ.

2. භික්ෂූහු සමඟිව රැස් වෙත් ද සමගිව නැගී යෙත් ද සමගිව සංඝ කර්ම සිදු කරත් ද ඒ තාක් අභිවෘද්ධියක් මිස පිරිහීමක් සිදු නොවේ.

3. යම්තාක් භික්ෂූහු නොපැනවූවක් නොපනවත් ද පැනවූවක් නොසිඳින්නාහු ද පැනවූතාක් සිකපද සමාදන් ව පවතී ද ඒතාක් භික්ෂූන්ගේ අභිවෘද්ධියක් ම සිදු වේ. පිරිහීමක් සිදු නොවේ.

4. භික්ෂූහු චිරරාත්‍රඥ සංඝපිතෘවරුන්ට ගරුසරු දක්වත් ද පුදපූජා කෙරෙත් ද ඔවුන්ගේ බසට ඇහුම්කම් දෙත් ද ඒතාක් භික්ෂූන්ගේ වැඩීමක් මිස පිරිහීමක් සිදු නොවේ.

5. යම්තාක් භික්ෂූහු යළි භවයට යාමට හේතුවන තෘෂ්ණාවේ වශගයට නොයෙත් ද ඒතාක් භික්ෂූන්ගේ යහපතක් ම සිදු වේ. පිරිහීමක් සිදු නොවේ.

6. යම්තාක් භික්ෂූහු වන සෙනසුන්හි කැමැත්තෙන් ආධ්‍යාත්මික ගුණයන් පිළිබඳ අපේක්ෂාවෙන් සිටිත් ද ඒතාක් යහපතක් ම සිදු වේ.

7. භික්ෂූහු 'භික්ෂූන් වෙත මෙතෙක් නොපැමිණි ප්‍රියශීලී සබ්‍රහ්මචාරීහු එන්නාහු ද පැමිණි සබ්‍රහ්මචාරීහු සුවසේ වෙසෙත් ද' යනුවෙන් සිහියෙන් වෙසෙත් ද ඒතාක් භික්ෂූන්ගේ අභිවෘද්ධියක් මිස පිරිහීමක් සිදු නොවේ.

භික්ෂූන් කෙරෙහි අභිවෘද්ධිය සිදුවීමට හේතුවන ඉහත ගුණාංග හත දේශනා කළ බුදුරජාණන් වහන්සේ මෙලෙස අභිවෘද්ධිය සඳහා හේතුවන **තවත් කරුණු හතක්** භික්ෂූන් වහන්සේලාට දේශනා කළහ.

1. භික්ෂූහු යම්තාක් (සීල, සමාධි, ප්‍රඥා ආදි උතුම් ගුණාංග වෙත සිත යොමු කරත් ද) එදිනෙදා සිව්පසය උදෙසා වූ සාමාන්‍ය කටයුතුවල පමණක් නොයෙදෙත් ද ඒතාක් භික්ෂූන්ගේ යහපත මිස පිරිහීමක් සිදු නොවේ.

2. යම්තාක් භික්ෂූහු නිසරු කථාවෙහි ඇලී නොසිටිත් ද ඒතාක් භික්ෂූන්ගේ යහපතක් ම සිදු වේ.

3. භික්ෂූහු නිතර නින්දට ඇලී වාසය නොකරත් ද ඒතාක් භික්ෂූන්ගේ යහපතක් මිස පිරිහීමක් සිදු නොවේ.

4. යම්තාක් භික්ෂූහු සමූහයා සමග එක්ව විසීමෙහි නොයෙදුණේ ද ඒතාක් භික්ෂූන්ගේ අභිවෘද්ධියක් ම සිදුවේ.

5. භික්ෂූහු යම්තාක් පාපී (ළාමක) ආශාවන්ට වසඟ ව නොසිටී ද ඒතාක් භික්ෂූන්ගේ යහපතක් මිස පිරිහීමක් සිදු නොවේ.

6. යම්තාක් භික්ෂූහු පාප මිතුරන් ඇත්තාහු නොවෙත් ද ඒතාක් භික්ෂූන්ගේ අභිවෘද්ධියක් මිස පිරිහීමක් සිදු නොවේ.

7. භික්ෂූහු යම්තාක් උතුම් රහත් භාවය හැර ඉන් මෙපිට අනෙකුත් අපේක්ෂා නැත්තේ ද ඒතාක් භික්ෂූන්ගේ දියුණුවක් ම සිදු වේ.

මෙලෙස භික්ෂූන්ගේ දියුණුව සඳහා හේතුවන කරුණු දේශනා කළ භාග්‍යවතුන් වහන්සේ **තවත් එබඳු අපරිහානිය ධර්ම හතක්** භික්ෂූන් උදෙසා දේශනා කළහ. ඒ අනුව භික්ෂූන් තුළ

1. ශ්‍රද්ධාව
2. පාපයන් කිරීමට පිළිකුල (හිරි)
3. පාපයන් කිරීමට බිය (ඔත්තප්ප)
4. බොහෝ ඇසූ පිරූ තැන් ඇති (බහුශ්‍රැත) බව
5. දැඩි වීර්යය (ආරද්ධ විරිය)
6. එළඹ සිටි සිහිය (උපට්ඨිතසති)
7. ප්‍රඥාව

යන කරුණු වෙත් ද ඒතාක් භික්ෂූන්ගේ යහපත මිස පරිහානියක් සිදු නොවේ. බුදුරජාණන් තවදුරටත් භික්ෂූන් තුළ පැවැතිය යුතු **සත්ත බොජ්ඣංග නමැති අපරිහානිය ධර්ම හතක්** සඳහන් කරති.

1. සති සම්බොජ්ඣංග
2. ධම්මවිචය සම්බොජ්ඣංග
3. විරිය සම්බොජ්ඣංග
4. පීති සම්බොජ්ඣංග
5. පස්සද්ධි සම්බොජ්ඣංග
6. සමාධි සම්බොජ්ඣංග
7. උපෙක්ඛා සම්බොජ්ඣංග

නිර්වාණාවබෝධයට අංග වන මෙම බෝධි අංග භික්ෂූහු නිතර භාවිත කෙරෙත් ද ඒතාක් භික්ෂූන්ගේ අභිවෘද්ධියක් මිස පරිහානියක් සිදු නොවේ.

තව ද භික්ෂූහු නිතර **සඤ්ඤා හතක් වඩත් නම් එය ද අපරිහානීය ධර්ම** වශයෙන් දැක්වේ.

1. අනිච්ච සඤ්ඤාව
2. අනත්ත සඤ්ඤාව
3. අසුභ සඤ්ඤාව
4. ආදීනව සඤ්ඤාව
5. පහාන සඤ්ඤාව
6. විරාග සඤ්ඤාව
7. නිරෝධ සඤ්ඤාව

සාක්ෂාත් කිරීමට ඍජුව උපකාරී වන අනිච්චාදි මෙම සඤ්ඤා හත ප්‍රගුණ කෙරෙත් ද ඒතාක් භික්ෂූන්ගේ අභිවෘද්ධියක් ම කැමැති විය යුතු ය. පිරිහීමක් සිදු නොවේ.

තව ද භික්ෂූහු,

1. අන් භික්ෂූන් කෙරෙහි ඇති තැනත් (අභිමුඛ) නැති තැනත් (අනභිමුඛ) මෛත්‍රී සහගත කාය කර්මයෙන් යුතු වේ ද

2. මෛත්‍රී සහගත වාක්කර්මයෙන් යුතු වේ ද

3. මෛත්‍රී සහගත මනෝ කර්මයෙන් යුතු වේ ද

4. යම්තාක් භික්ෂූහු සංඝයා නමින් ලැබෙන සිව්පසය (යටත් පිරිසෙයින් තම පාත්‍රයට ලැබෙන බත් පත පවා) සබ්‍රහ්මචාරී භික්ෂූන් වහන්සේට සාධාරණව බෙදා වළදා ද

5. පිරිසිදු සිල්වත් ජීවිත ගත කෙරෙත් ද

6. දුක් ගෙවීමට හේතුවන චතුරාර්ය සත්‍යාවබෝධයට ඉවහල් වන සම්මා දිට්ඨියෙන් යුතු ව සබ්‍රහ්මචාරීන් හමුවෙහිත් නොහමුවෙහිත් වෙසෙත් ද

ඒතාක් භික්ෂූන්ගේ අභිවෘද්ධියක් ම සිදු වේ. මෙලෙස **අපරිහානිය ධර්ම හයක්** දේශනා කළහ.

මෙලෙස අපරිහානිය ධර්ම විවිධ ආකාරයෙන් දේශනා කළ බුදුරජාණන් වහන්සේ ඉන්පසු භික්ෂූන් තවදුරටත් දැහැමි කථාවෙන් අනුග්‍රහ කළහ.

මෙහි දී භාග්‍යවතුන් වහන්සේ සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂාව පැහැදිලි කරමින් සීලයෙන් වඩන ලද සමාධිය මහත්ඵල බවත් සමාධියෙන් වඩන ලද ප්‍රඥාව මහත්ඵල බවත් මහානිසංස බවත් දේශනා කළහ. එලෙස ප්‍රඥාවෙන් වඩන ලද සිත කාමාශ්‍රව, භවාශ්‍රව, අවිද්‍යාශ්‍රව යන ත්‍රිවිධ ආශ්‍රවයන්ගෙන් මැනැවින් මිදෙන බව ද සඳහන් කළහ. රජගහ නුවරදී මෙලෙස අනුශාසනා කළ බුදුරදහු අනඳ හිමියන් සමග අම්බලට්ඨිකාවට වැඩම කළහ. එහි දී උන් වහන්සේ තවදුරටත් ඉහත අනුශාසනාවෙන් ම භික්ෂූන්ට ධර්ම දේශනා කළහ. ඉන්පසු අම්බලට්ඨිකාවෙන් නික්ම නාලන්දාවෙහි පාවාරිකා අඹ වනයට වැඩම කළහ.

මෙකල්හි සැරියුත් මහ රහතන් වහන්සේ බුදුරදුන් වෙත පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ ගුණ ප්‍රකාශ කළහ. බුදුරදුන්ගේ උතුම් සම්බුද්ධත්වයත් ප්‍රඥාවේ මහත්වයත් අගය කරමින් එබඳු ගුණයෙන් හෙබි අන් උතුමකු අතීතයෙහි නොවූ බවත් අනාගයෙහි නොවන බවත් දැනුදු නොවන බවත් සඳහන් කරමින් සිංහනාද පැවැත්වූහ. මෙහි දී බුදුරදුන් සැරියුත් මාහිමියන්ගේ ප්‍රඥා මහිමයට ප්‍රශංසා කළ අතර අතීතයෙහි විසූ සිල් ගුණ සපිරි උතුමන්ගේ ස්වභාවය ද සැරියුත් හිමියන්ට පැහැදිලි කළහ.

ඉන්පසු පාටලීග්‍රාමයට වැඩම කළ බුදුරජාණන් වහන්සේ එහි දී සීලවිපත්තියෙහි ආදීනවත් සීලසම්පත්තියෙහි ආනිසංසත් දේශනා කළහ. දුස්සීල තැනැත්තාගේ **සීලවිපත්තියෙහි ආදීනව පහකි.** එනම්

1. ප්‍රමාදී බවින් භෝග විපත්තියට පැමිණීම
2. සීලයෙන් පිරිහුණු තැනැත්තාට ලාමක අපකීර්තියක් පැතිරීම
3. දුස්සීල තැනැත්තා කිසියම් ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණ පිරිසක් වෙත එළඹෙන්නේ නම් බියෙන් සැකෙන් යුතුව තෙද නැතිව පිවිසීමට සිදුවීම
4. දුස්සීල තැනැත්තා සිහිමුලාව කළුරිය කිරීම
5. දුස්සීල තැනැත්තා මරණින් මතු දුගතිගාමී වීම

මෙලෙස දුස්සීල බවෙහි ආදීනව ප්‍රකාශ කළ බුදුරජාණන් වහන්සේ සිල්වත් බවෙහි අනුසස් ද සඳහන් කළහ. ඒ අනුව **සිල්වත් බවෙහි අනුසස් පහකි.**

1. සිල්වත් තැනැත්තා නොපමා බවින් මහත් භෝග සම්පත්තියක් ලබයි.
2. සිල්වත් තැනැත්තාගේ ගුණ කීර්තිය පැතිරෙයි.
3. සිල්වත් තැනැත්තා ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණ පිරිසක් වෙත එළඹෙන්නේ නිර්භයව එළඹෙයි.
4. සිල්වතා මනා සිහි ඇතිව කළුරිය කරයි.
5. සිල්වතා මරණින් මතු සුගතිගාමී වේ.

භාග්‍යවතුන් වහන්සේ රැය බොහෝ වේලාවක් පාටලීග්‍රාමවාසී උවසුවන්ට දුසිල්බවෙහි ආදීනව හා සිල්වත්බවෙහි ආනිසංස දක්වමින් ධර්මය දෙසා **රෑ බෝ වී ඇති නිසා ඔවුන්ට යාමට උනන්දු කරවූහ.** ඉන්පසු එම උවසුවන් බුදුරදුන්ට සමුදී නික්ම ගියහ.

මෙකල්හි සුනීධ - වස්සකාර යන මගධ මහාමාත්‍යවරු දෙදෙනා පාටලීග්‍රාමයෙහි නුවරක් නිර්මාණය කරමින් සිටියහ. මෙලෙස නිර්මාණය කරන නගරයෙහි ඒ ඒ ගෙවතුවලට දහස්ගණන් දෙවිවරු අරක් ගනිති. ඒ අතරින් මහානුභාව සම්පන්න දෙවිවරුන් අරක්ගන්නා ගෙවතුවලට මහතෙදැති රජවරුන්ගේ මහඇමැතියන්ගේ සිත් නැමේ. යම් පෙදෙසක මැදුම් තෙදැති දෙවිවරුන් අරක්ගනිත් ද මැදුම් තෙදැති රජ ඇමැතිරුවන්ට ඒ පිළිබඳ සිත් නැමේ. යම් පෙදෙසක හීන තෙදැති දෙවිවරුන් අරක් ගනිත් ද එබඳු හීන තෙදැති රජ ඇමැවරුන්ට ඒ ගෙවතුවලට සිත් නැමේ. භාග්‍යවතුන් වහන්සේ මේ

නගරය පිළිබඳ දිවැසින් දැක එම නගරය පිළිබඳ විස්තර කළ අතර අනාගතයෙහි එය වෙළෙඳ ගනුදෙනු කරන ප්‍රධාන නගරයක් වන බව ද සඳහන් කළහ. මේ අතර සුනීධ වස්සකාර ඇමැතිවරු බුදුරදුන්ට දානයට ආරාධනා කළ අතර බුදුරදහු ඔවුන් වෙත කරුණාවෙන් දන් වළඳා අනුශාසනා කළහ. මෙහි දී භාග්‍යවතුන් වහන්සේ දක්ෂිණාවක් අවසානයෙහි දෙවියන්ට පින් අනුමෝදන් කිරීමෙන් දෙවියන්ගේ ආරක්ෂාව සැලසෙන ආකාරය ද සඳහන් කළහ.

***'යස්මිං පදෙසෙ කප්පෙති වාසං පණ්ඩිතජාතියො***
***සීලවන්තෙත්ථ භොජෙත්වා සඤ්ඤතෙ බ්‍රහ්මචාරයො,***
***යා තත්ථ දෙවතා ආසුං තාසං දක්ඛිණමාදිසෙ'.***
***'තා පූජිතා පූජයන්ති මානිතා මානයන්ති නං,***
***තතො නං අනුකම්පන්ති මාතා පුත්තං'ව ඔරසං,***
***දෙවතානුකම්පිතො පොසො සදා භද්‍රානි පස්සති'.*** (140 පිට)

දානය වළඳා බුදුරදුන් නික්මුණු දොරටුව **'ගෞතමද්වාරය'** නමින් ද ස්නානය සඳහා ගංගා නම් ගඟට බැසි තොට **'ගෞතමතීර්ථ'** නමින් ද එම ඇමැතිවරුන් විසින් නම් කරන ලදි.

අනතුරුව බුදුරජාණන් වහන්සේ අනඳ හිමියන් සමග පාටලීග්‍රාමයෙන් නික්ම කෝටිග්‍රාමයට එළඹියහ. එහි දී බුදුරජාණන් වහන්සේ චතුරාර්ය සත්‍යය අවබෝධ නොවීම හේතුවෙන් සත්ත්වයන් සසර බොහෝ කාලයක් සැරිසරන ආකාරයත් තමන් වහන්සේ **චතුරාර්ය සත්‍යය** අවබෝධ කොට භව තෘෂ්ණාව සිඳින ලද අයුරුත් තෘෂ්ණා රැහැන සිඳලූ ආකාරයත් මින් මතු භවයට නොයන බවත් සඳහන් කළහ. තව ද සීල, සමාධි, පඤ්ඤා යන **ත්‍රිවිධ ශික්ෂාවෙහි වැදගත්කම මෙහි දී යළිත් අවධාරණය කළහ.**

කෝටිග්‍රාමයෙන් නික්මුණු බුදුරජාණන් වහන්සේ පසුව නාදිකා නම් ගමට එළඹියහ. නාදිකා ගමෙහි දී අනඳ මාහිමියන් වහන්සේ එහි කලින් විසූ සාළ්හ භික්ෂුව, නන්දා භික්ෂුණිය, සුදත්ත, කකුධ, කාලිංග, නිකට, කටිස්සභ, තුට්ඨ, සන්තුට්ඨ, භද්ද, සුභද්ද යන උපාසකවරුන්, සුජාතා නම් උවැසිය යන අය මිය ගොස් දැන් කොහි ඉපිද සිටිත් දැයි බුදුරදුන්ගෙන් විමසා සිටියහ. මෙහි දී භාග්‍යවතුන් වහන්සේ ඒ ඒ අය ලැබූ මගඵල අනුව පිරිනිවන් පෑ අය හා සුගතිගාමී වූ අය පිළිබඳ විස්තරයක් කළහ. ඒ අතර ගිහියන් අතුරින් පණහකට අධික පිරිසක් අනාගාමී ව බඹලොව ඉපදුණ බවත් අනූවකට අධික පිරිසක් සකදාගාමී ව සුගතිගාමී වූ බවත් පන්සියයකට අධික පිරිසක් සෝවාන් ව සුගතිපරායණ වූ බවත් සඳහන් කළහ. ඉන්පසු බුදුරදුන් අනඳ මාහිමියන්ට දේශනා කළේ මිය යන සෑම දෙනෙක් පිළිබඳව ම පරලොව ගතිය පිළිබඳව දේශනා කිරීම තථාගතයන් වහන්සේට වෙහෙසක් බැවින් තමාට ම මිය ගිය අය පිළිබඳ දැක ගැනීමේ **'දහම් කැඩපත'** ඇති බවයි. ඒ අනුව **යමෙක් බුදුන්, දහම්, සඟුන් සරණ ගියේ ද ආර්යකාන්ත සීලයෙන් යුක්ත වූයේ ද තමා සතර අපායෙන් මිදී ඇති බවට එය සහතියක් බවත් මේ දහම් සතරෙහි ස්ථිරව බැස ගැනීම සෝවාන් බවට පත් වීමේ සලකුණක් බවත් දේශනා කළහ.** සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂාවේ වැදගත්කම ගැන තවදුරටත් පැහැදිලි කළහ.

නාදිකා ගමින් නික්මුණු බුදුරජාණන් වහන්සේ අනඳ මාහිමියන් සමග විසල් පුරයට එළඹියහ. එහි අම්බපාලී වනයෙහි වැඩ වෙසෙමින් භික්ෂූන් වහන්සේට අනුශාසනා කළහ. එහි දී සිහිනුවණින් වාසය කිරීමේ වැදගත්කම අවධාරණය කරමින් **සතර සතිපට්ඨාන දේශනාව සිදු කළහ.**

මෙහි දී අම්බපාලි නම් ප්‍රසිද්ධ ගණිකාව බුදුරදුන් විසල් පුරයට වැඩම කොට තම අඹවනයෙහි වැඩ වෙසෙන බව දැනගෙන ඊට සතුටු වී මනාව සැරසූ යානයන්හි නැගී බුදුරදුන් හමුවීමට පැමිණියහ. යානයෙන් බැස බුදුරදුන් වෙත ගිය අම්බපාලි උන් වහන්සේට වැඳ නමස්කාර කොට ගරුසරු දක්වා බුදුරදුන් වෙතින් ධර්මශ්‍රවණය කළා ය. අනතුරුව පසුදින භික්ෂු සංඝයා සමග තම නිවසෙහි දනට වඩනා ලෙස අම්බපාලි භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කළා ය. මේ අතර බුදුරදුන් විසල් පුරයට වැඩි බව දැනගත් ලිච්ඡවීහු මනාව සැරසූ යානයන්හි නැගී බුදුරදුන් බැහැ දැකීමට පැමිණියහ. බුදුරදුන්ට සමුදී

නික්ම යන අම්බපාලී තමාගේ රියෙන් ලිච්ඡවීන්ගේ රිය ගටමින් යුහුසුළුව යෑමට උත්සාහ කළ හෙයින් ඊට හේතුව කුමක්දැයි ලිච්ඡවීහු ප්‍රශ්න කළහ. අම්බපාලිගේ පිළිතුරු වූයේ බුදුරදුන් හෙට දින තම නිවසේ දනට වඩනා බැවින් මෙලෙස යුහුසුළුව යෑමට උත්සාහ කරන බවයි. මෙහිදී ලිච්ඡවීන් ප්‍රකාශ කළේ අම්බපාලිගේ දානය තමාට පවරා දුනහොත් කහවණු ලක්ෂයක් දීමට කැමැති බවයි. **කහවණු ලක්ෂයක් නොව දනවු සහිත සියලු විසල් පුරය පවරා දුන්න ද තමා භාරගත් මහත්ඵල ඇති මෙම දානය නොදෙන බවයි.** එකල්හි ලිච්ඡවීහු පින්වත, ඒකාන්තයෙන් ස්ත්‍රියක විසින් අපව පරාජය කරන ලදැයි අසුරු ගැසූහ.

මනාව සැරසුණු ලිච්ඡවීන් දුරදී ම එන බව දුටු භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා ප්‍රකාශ කළේ 'මහණෙනි, තව්තිසා වැසි දෙවියන් නොදක්නාහු නම් මේ ලිච්ඡවීන් දිහා බලන ලෙසයි. එම ලිච්ඡවීහු තවුතිසා වැසි දෙවියන්ට සමකොට සලකන ලදහ. යානවලින් බැස බුදුරදුන් වෙත පා ගමනින් පැමිණි ලිච්ඡවීහු උන් වහන්සේට ගරුසරු දක්වා බණ අසා ඔවුහු ද බුදුරදුන්ට හෙට දින දනට ආරාධනා කළහ. නමුත් ඒ වන විට බුදුරජාණන් වහන්සේ අම්බපාලිගේ ආරාධනය පිළිගෙන සිටි හෙයින් ලිච්ඡවීන්ගේ ආරාධනය නොපිළිගත්හ. යළිත් ලිච්ඡවීන් ප්‍රකාශ කළේ ස්ත්‍රියක විසින් අපව පරාජය කරන ලද බවයි. කෙසේ වෙතත් බුදුරදුන්ගේ වචනය පිළිගෙන සතුටුව උන් වහන්සේට වැඳ ලිච්ඡවීහු නික්ම ගියහ.

පසුදින අම්බපාලිගේ නිවසට දනට වැඩම කළ බුදුරජාණන් වහන්සේ දන් වළඳා ඇයට දහම් දේශනා කළහ. එහිදී අම්බපාලි තම ආරාමය (***ඉමාහං භන්තේ, ආරාමං බුද්ධපමුඛස්ස භික්ඛුසංඝස්ස දම්මී,ති.*** 154 පි.) බුදුපාමොක් මහ සඟනට සඟසතු කොට පූජා කළා ය. බුදුරදුන් ඇයට පුණ්‍යානුමෝදනා කොට දහමෙහි හැසිරීමට ඇයව උනන්දු කරවා හුනස්නෙන් නැගී වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ අම්බපාලී වනයෙහි වැඩ වෙසෙමින් ත්‍රිවිධ ශික්ෂාවෙහි හැසිරීමට භික්ෂූන් තවදුරටත් උනන්දු කරවූහ.

ඉන්පසු බුදුරජාණන් වහන්සේ අම්බපාලි අඹ වනයෙන් නික්ම බේලුව ගමට වැඩි සේක. එහි දී බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා ප්‍රකාශ කළේ තමන් බේලුව ගමෙහි වස් විසීමට කැමැති බවත් ඔබ වහන්සේලා විසල් පුර හාත්පස වැඩ වෙසෙන භික්ෂූන් මුණගැසී දැක හඳුනාගෙන ඇසුරු කරන ලෙසයි. භාග්‍යවතුන් වහන්සේ අනඳ මාහිමියන් සමග බේලුව ගමෙහි වස් විසූ අතර එහි දී උන් වහන්සේට දරුණු උදරාබාධයක් හටගැනුණි. උන් වහන්සේ සිහි නුවණින් සලකමින් එයින් නොපෙළෙමින් ඒ වේදනාව ඉවසූහ. මෙහි දී බුදුරදුන් සිහිපත් වූයේ තමන් වහන්සේ උපස්ථායක නොඅමතා භික්ෂූන්ට නොදන්වා පිරිනිවන් පෑම නුසුදුසු ***බවයි. 'මම මේ උදරාබාධය වීර්යයෙන් මැඩගෙන ජීවිත සංස්කාරය ඉටා වසන්නෙම් නම් මැනැවැයි'*** උන් වහන්සේට සිත් විය. ඒ අනුව ආබාධය වීර්යයෙන් මැඩ ජීවිත සංස්කාරය අධිෂ්ඨාන කොට වැඩ විසූහ. මෙහි දී බුදුරදුන් ගිලන් බවින් නැඟ සිටි අතර පසුව වෙහෙරින් නික්ම වෙහෙර ඉදිරිපස සෙවණෙහි පනවන ලද අසුනෙහි වැඩ විසූහ. මෙහි දී අනඳ මාහිමියෝ බුදුරදුන්ගේ රෝගාබාධය නිසා මහත් සේ පීඩාවට පත් වූ බවත් තමාට දිශාවන් පවා නොපෙනී ගිය බවත් සඳහන් කළහ. එතෙකුදු වුවත් බුදුරජාණන් වහන්සේ අවසාන වශයෙන් අවවාදයක් වදාරණ තෙක් පිරිනිවන් නොපාන බවට තමා කිසියම් ආස්වාදයක් තිබූ බවත් සැළ කළහ.

මෙහි දී බුදුරජාණන් වහන්සේ සඳහන් කළේ තමන් වහන්සේ සතුව සඟවා ගත් කිසිවක් එනම් ගුරුමුෂ්ඨියක් නැති (***නත්ථානන්ද, තථාගතස්ස ධම්මේසු ආචරියමුට්ඨි*** - *158 පිට*) බවත් අභ්‍යන්තර බාහිර වශයෙන් නොසඟවා සියල්ල දේශනා කරන ලද බවත් ය. තවද තමන් වහන්සේ භික්ෂු සංඝයා පරිහරණය කරන්නේ යැයි කියා හෝ භික්ෂූන් වහන්සේ තමන් උදෙසා සිටිය යුතු යැයි කියා හෝ හැඟීමක් තමන් වහන්සේ තුළ නොපවතින බවයි.

මේ අවස්ථාවෙහි බුදුරදහු තමන් වහන්සේගේ ශරීරයේ ස්වභාවය විස්තර කළහ. 'අනඳයෙනි, මම දැන් ජීර්ණයෙමි, වෘද්ධයෙමි, මහලුයෙමි. අසූ වයස් ඇත්තෙමි. දිරාපත් වූ ගැලක් චක්‍රබන්ධනාදි පිළිසකරින් යැපෙන්නාක් මෙන් මේ කය ද රහත්ඵල සමවත් නමැති පිළිසකරින් යැපෙන්නේ ය. අනඳ,

තථාගතයෝ රූප නිමිත්තාදි සියලු නිමිති නොමෙනෙහි කිරීමෙන් ඇතැම් වේදනාවන්ගේ නිරෝධයෙන් නිමිති රහිත චිත්ත විමුක්තියට පැමිණ වෙසෙත් ද, අනඳයෙනි, එසමයෙහි මේ කය අතිශයින් පහසු වූයේ වේ'.

> ***'තස්මාතිහානන්ද, අත්තදීපා විහරථ අත්තසරණා අනඤ්ඤසරණා, ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා'*** (158 පි.)

'එහෙයින් ආනන්ද, තෙපි තමා දිවයිනක් (පහනක්) කොට තමා සරණ කොට වසන්න. අන් සරණක් නොමැත. ධර්මය දිවයිනක් (පහනක්) කොට ධර්මය සරණ කොට වසන්න. අන් සරණක් නොමැත'.

භාග්‍යවතුන් වහන්සේ මෙහි ලා තමා පහනක්, දිවයිනක් කොට වාසය කරන්න යනුවෙන් අනුශාසනා කරන්නේ නිරතුරුව සිහියෙන් හා නුවණින් වාසය කරන ලෙසයි. එනම් හේතුඵල දහම (පටිච්ච සමුප්පාදය) නුවණින් දකිමින් සම්මා දිට්ඨිය පෙරටු කොටගත් සතර සතිපට්ඨානය වඩමින් තම කය හා සිත පිළිබඳ පූර්ණ අවධානයෙන් හැම මොහොතක ම අප්‍රමාදීව වාසය කිරීමයි. තම සිත්හි පවත්නා දැඩි ලෝභය හා ද්වේෂය දුරු කොට තම කය, වේදනා, සිත, හා සිතිවිලි පිළිබඳ සතිමත් බව දියුණු කිරීම මෙහිදී සිදු වේ. එවිට තම සිතට නීවරණ නොනැගෙන අතර නිරතුරුව සිදුවන ස්කන්ධ පංචකයේ හටගැනීම් නිරුද්ධ වීම් නුවණින් දැකීම තුළින් දුකින් නිදහස් වීමේ මාවත විවර වේ.

ඉන්පසු බුදුරජාණන් වහන්සේ පෙරවරුවෙහි හැඳ පෙරවා පාසිවුරු ගෙන විසාලාවෙහි පිණ්ඩපාතයෙහි හැසිර පස්වරුවෙහි දිවාවිහරණය සඳහා අනඳ මාහිමියන් සමග චාපාල චෛත්‍ය ස්ථානයට වැඩම කළහ. එහි අනඳ හිමියන් විසින් පැනවූ අසුනෙහි හිඳගත් භාග්‍යවතුන් වහන්සේ විසල් පුර, උදේන චේතිය, ගෝතමක චේතිය, සත්තම්බ චේතිය, බහුපුත්තක චේතිය, සාරන්දද චේතිය, චාපාල චේතිය ආදි තැන්හි රමණීය බව අනඳ හිමියන්ට සඳහන් කළහ (160 පිට).

මෙහි දී බුදුරජාණන් වහන්සේ ආනන්ද මාහිමියන්ට විශේෂ කරුණක් ප්‍රකාශ කළහ. එනම් යමෙක් සතර ඍද්ධිපාද මැනැවින් ප්‍රගුණ කළේ ද වඩනා ලද්දේ ද තහවුරු කරන ලද්දේ ද යළි යළිත් වඩන ලද්දේ ද එවැන්නකුට අවශ්‍ය නම් ආයු කල්පයක් හෝ ඊට මදක් වැඩි කලක් ලොව වාසය කළ හැකි බවයි. තුන් වරක් ම බුදුරදුන් විසින් මෙලෙස තථාගතයන් වහන්සේගේ සුවිශේෂී හැකියාව පිළිබඳවත් යමකු ආරාධනා කළහොත් ආයු කල්පයක් විසිය හැකි බවත් යළි යළිත් ප්‍රකාශ කළහ. එහෙත් මරු වසඟයෙහි සිටි බැවින් 'එසේ නම් ස්වාමීනි, ලොවට අනුකම්පා පිණිස ආයු කල්පයක් වැඩ වසන්න' යනුවෙන් බුදුරදුන්ට ආරාධනා කිරීමට අනඳ මාහිමියන්ට නොහැකි විය. ඉන්පසු බුදුරදුන් අනඳ හිමියන්ගෙන් වෙන් ව කිසියම් රුක් මුලක වැඩ වෙසෙන අවස්ථාවෙහි මාරයා පැමිණ බුදුරදුන්ට පිරිනිවන් පාන ලෙස ඇරැයුම් කළේ ය. බුදුරදුන්ට මීට පෙර ද අවස්ථා දෙකකදී ම මරුවා මෙලෙස ඇරැයුම් කළ ද ඒ අවස්ථා දෙකෙහි දී ම උන් වහන්සේ ප්‍රකාශ කර සිටියේ තම ශ්‍රාවකයන් ව්‍යක්ත විනීත විශාරදාදි ලක්ෂණයන්ගෙන් යුක්ත වන තුරු පිරිනිවන් නොපානා බවයි. මේ අවස්ථාවෙහි මාරයා සඳහන් කළේ දැන් ශ්‍රාවක පිරිස ව්‍යක්ත, විනීතාදි ගති ලක්ෂණයන්ගෙන් යුක්ත හෙයින් පිරිනිවන් පෑමට සුදුසු අවස්ථාව බවයි. මෙහි දී බුදුරදුන් සඳහන් කළේ 'පවිටු මාරය, නුඹ මන්දෝත්සාහී වෙව. නොබෝ කලකින් තථාගතයන්ගේ පිරිනිවීම වන්නේ ය' යනුවෙනි. ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ 'මෙයින් තෙමසකට පසු චාපාල චෛත්‍යයේ දී පිරිනිවන් පාන්නෙමි' යි ආයු සංස්කාරය අත්හළහ. බුදුරදුන් ආයු සංස්කාරය අත්හළ කල්හි බිහිසුණු ලොමුදහ ගැන්මක් ඇති කරවන මහත් භූමි කම්පාවක් හටගැනුණි. මෙම කම්පනයෙන් නැඟී සිටි අනඳ මාහිමියන් බුදුරදුන් වෙත පැමිණ මෙලෙස පෘථිවිය කම්පා වීමේ හේතු විමසූ විට බුදුරදුන් ප්‍රකාශ කළේ **මහ පොළොව අවස්ථා අටකදී කම්පා වන බවයි** (166-70 පිට). ඒ අනුව

1. මේ පෘථිවිය ජලය ආධාර කොට ඇත. ජලය වාතය ආධාර කොට ඇති අතර වාතය අහසෙහි සිටියේ වේ. යම් විටෙක වාතය හමන විට ජලය සෙලවෙන අතර ජලය සෙලවෙන පෘථිවිය සෙලවෙන බව බුදුරදහු සඳහන් කළහ. මහත් භූමිකම්පනයට පළමු හේතුව මෙයයි.

2. තවද සිත මැනැවින් වසඟ කොටගත් ඍද්ධිමත් ශ්‍රමණ බ්‍රාහ්මණයෙක් හෝ දෙවි බඹ කෙනෙක් වෙත් ද ඔවුන් පෘථිවි සංඥාව මඳ ලෙසත් ආපෝ සංඥාව අප්‍රමාණ ලෙසත් වැඩීමේ ප්‍රතිඵලයක් ලෙස මෙලෙස භූකම්පන සිදු කළ හැකි බවයි.

3. බෝසත් උතුමකු අවසන් වරට මිනිස් ලොව මව්කුස සිහිනුවණින් යුතු ව මව්කුස පිළිසිඳ ගන්නා අවස්ථාවෙහි ද මෙබඳු භූමි කම්පනයක් සිදු වේ.

4. එලෙස පිළිසඳගත් පින්වත් කුමරු මව්කුසින් බිහිවන විට ද පෘථිවිය කම්පා වේ.

5. තථාගතයන් වහන්සේ අනුත්තර වූ සම්මා සම්බුද්ධත්වය සාක්ෂාත් කරන අවස්ථාවෙහි ද මෙලෙස කම්පනයක් වේ.

6. එම තථාගතයන් වහන්සේ පළමු වරට දම්සක් සූත්‍ර දේශනාව පවත්වන අවස්ථාවෙහි දී ද භූමිය කම්පා වේ.

7. තථාගතයන් වහන්සේ සිහිනුවණින් ආයුසංස්කාරය අත්හරින කල්හි ද පෘථිවිය කම්පා වේ.

8. තථාගතයන් වහන්සේ අනුපදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පානා කල්හි ද පෘථිවිය කම්පා වේ.

මෙලෙස මහපොළොව කම්පා වන අවස්ථා අටක් පිළිබඳව භාග්‍යවතුන් වහන්සේ අනඳ මාහිමියන්ට දේශනා කළහ.

ඉන්පසු බුදුරජාණන් වහන්සේ ලොව වෙසෙන අට වැදැරුම් පිරිසක් පිළිබඳ සඳහන් කළහ. එනම් ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණ, චාතුම්මහාරාජික, තාවතිංස, මාර, බ්‍රහ්ම (170 පි.) වශයෙනි. බුදුරදුන් මෙම පිරිස් අට වෙත පැමිණ ඔවුන්ගේ වර්ණය, කටහඬ ආදියෙන් ඔවුන්ට නොදෙවනි ලෙස අනුශාසනා කොට ඔවුන්ගේ සිත් සතුටු කොට අවශ්‍ය විටෙක ඔවුන්ට හඳුනා ගත නොහැකි පරිදි අතුරුදහන් විය හැකි බව ද සඳහන් කළහ. විශ්වයේ වෙසෙන සුගතිගාමී සියලු ප්‍රබල සත්ත්වයන් මෙම පිරිස් අටට ඇතුළත් වේ. ඒ සියල්ල අබියස තමන් වහන්සේ සතු ප්‍රඥාවෙන් ඍද්ධියෙන් බබලමින් සිටීමේ හැකියාව බුදුරදුන් සතුව පවතී.

අට පිරිස පිළිබඳව සඳහන් කිරීමෙන් පසු අෂ්ට අභිභායතන (172 පි.), අෂ්ට විමොක්ඛ (174 පි.) පිළිබඳව ද කරුණු ඉදිරිපත් කළහ.

මේ අතර මාරයා බුදුරදුන් වෙත පැමිණ උන්වහන්සේට පිරිනිවීනට ඇරයුම් කළ අවස්ථා පිළිබඳව අනඳ තෙරුන්ට සඳහන් කළහ. ඒ අනුව බුදුරදුන් සම්බුද්ධත්වයට පත් වූ නොබෝ කලකින් උරුවේලාවෙහි අජපල් නුග රුක මුල සිටින අවස්ථාවෙහි උන් වහන්සේට පිරිනිවනට ආරාධනා කළ විට තම ශ්‍රාවකයන් ශක්තිමත් වන තුරු පිරිනිවන් නොපාන බව සඳහන් කළ බව ද මීට ටික දිනකට පෙර උන්වහන්සේට ඇරයුම් කළ විට තමන් වහන්සේ මින් තෙමසකට පසු පිරිනිවන බව සඳහන් කළ බවද අනඳ හිමියන්ට පැවැසූහ.

එවිට ආනන්ද මාහිමියන් වහන්සේ **'බොහෝ දෙව් මිනිසුන්ට හිතසුව පිණිස ආයුෂ් කල්පයක් තවදුරටත් වැඩ සිටින්න'** (180 පි.) යනුවෙන් බුදුරදුන්ට ඇරයුම් කළහ. එවිට බුදුරදුන්ගේ අදහස වූයේ අනඳ හිමියන් ඇරයුම් කිරීමට දූන් ප්‍රමාද වැඩි බවයි. අනඳ හිමියන් යළි යළි ඉල්ලා සිටින

විට භාග්‍යවතුන් වහන්සේ **'ආනන්ද, තථාගතයන්ගේ සම්බුද්ධත්වය ඔබ පිළිගන්නේ නම් යළි යළිත් මෙලෙස යාචනය නොකරන්න'** (180 පි.) යැයි වදාළහ.

බුදුරදුන් පිරිනිවීමට තීරණය කිරීම පිළිබඳ අනඳ මාහිමියන් බලවත් සංවේගයට පත් අවස්ථාවේදී සියලු ප්‍රිය මනාප දේවලින් වෙන් වී යාමට සිදු වන බව සියල්ල නැසෙන බව කිසිවක් තමන් කැමැති පරිදි නොපවත්නා බව තමන් වහන්සේ කල්තියා ම දේශනා කළ බව අනඳ මාහිමියන්ට බුදුරදහු යළිත් සිහිපත් කර දුන්හ. තව ද බුදුරදුන් ලොවට හිතසුව පිණිස දේශනා කොට වදාළ බ්‍රහ්මචර්යාව බොහෝ කලක් පැවැතීමට ඉවහල් වන සත්තිස් බෝධිපාක්ෂික ධර්ම බුදුරජාණන් වහන්සේ යළිත් වරක් සිහිපත් කර දුන්හ.

එනම් :-

- ▲ **සතර සතිපට්ඨානා** (කාය, වේදනා, චිත්ත, ධම්ම)
- ▲ **සතර සම්‍යග් ප්‍රධාන වීර්ය** (නූපන් අකුසල් නොඉපිදවීම, උපන් අකුසල් ප්‍රහානය, නූපන් කුසල් ඉපිදවීම, උපන් කුසල් වැඩිදියුණුව)
- ▲ **සතර ඍද්ධිපාද** (ඡන්ද, චිත්ත, විරිය, වීමංසා)
- ▲ **පංච ඉන්ද්‍රිය** (සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා)
- ▲ **පංච බල** (සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤ
- ▲ **සත්ත බොජ්ඣංග** (සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා)
- ▲ **ආර්ය අෂ්ටාංගික මාර්ග** (සම්මා දිට්ඨි, සංකප්ප, වාචා, කම්මන්ත, ආජීව, වායාම, සති, සමාධි)

ඉන්පසු සියලු සංස්කාරයන්ගේ නැසෙන බවත් තථාගතයන් වහන්සේ තව නොබෝ කලකින් තෙමසකට පසු පිරිනිවන බවත් ප්‍රකාශ කොට අප්‍රමාදීව දහමෙහි හැසිරෙන ලෙස තවදුරටත් දේශනා කළහ.

***'හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වො. වයධම්මා සංඛාරා. අප්පමාදෙන සම්මාදෙථ. නචිරං තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති. ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සතී'ති.*** (188 පි.)

*'පරිපක්කො වයො මය්හං පරිත්තං මම ජීවිතං පහාය වො ගමිස්සාමි කතම්මෙ සරණමත්තනො.*
*අප්පමත්තො සතිමන්තො සුසීලා හොථ භික්ඛවෙ, සුසමාහිතසංකප්පා සචිත්තමනුරක්ඛථ.*
*යො ඉමස්මිං ධම්මවිනයෙ අප්පමත්තො විහෙස්සති, පහාය ජාති සංසාරං දුක්ඛස්සන්තං කරිස්සති'.*
(188 පි.)

විසල් පුර සිට භණ්ඩග්‍රාමයට වැඩම කළ බුදුරජාණන් වහන්සේ එහි දී ආර්ය ධර්ම හතර සිහිපත් කළහ. ඒ අනුව ආර්ය ධර්මයන් හතරක් අවබෝධ නොවීම හේතුවෙන් තමාගේ ද අන් අයගේ ද සසර ගමන ඉතා දිගු කලක් සිදු වූ බව දේශනා කළහ. ඒවා නම්

1. ආර්ය වූ සීලය අවබෝධ නොවීම
2. ආර්ය වූ සමාධිය අවබෝධ නොවීම
3. ආර්ය වූ ප්‍රඥාව අවබෝධ නොවීම
4. ආර්ය වූ විමුක්තිය අවබෝධ නොවීම

යන කරුණු හතර අවබෝධ නොවීම හේතුවෙන් සත්ත්වයා අනන්ත සසර සැරිසරන අයුරු භාග්‍යවතුන් වහන්සේ සඳහන් කළහ. දැන් මේ ධර්ම හතර අවබෝධ වීම හේතුවෙන් එය ලොව දේශනා කොට තථාගතයන් වහන්සේ පිරිනිවන බව තවදුරටත් වදාළහ.

*'සීලං සමාධි පඤ්ඤා ච විමුත්තා ච අනුත්තරා, අනුබුද්ධා ඉමෙ ධම්මා ගොතමෙන යසස්සිනා.*
*ඉති බුද්ධො අභිඤ්ඤාය ධම්මමක්ඛාසි භික්ඛුනං, දුක්ඛස්සන්තකරො සත්ථා චක්ඛුමා පරිනිබ්බුතො'ති*

මෙහි දී නැවතත් ත්‍රිවිධ ශික්ෂාවෙහි වැදගත්කම අවධාරණය කරමින් එහි අප්‍රමාදීව විසීමට භික්ෂූන් උනන්දු කරවූහ.

භණ්ඩගාමයේ සිට හත්ථිගාම, අම්බගාම, ජම්බුගාම පසුකොට භෝග නගරයට වැඩම කළ බුදුරජාණන් වහන්සේ එහි දී **සතර මහාපදේශ** දේශනා කළහ. එනම්

1. යම් මහණෙක් 'මේ ධර්ම ය, මේ විනය ය, මේ ශාස්තෘ ශාසනය ය. මම භාග්‍යවතුන් වහන්සේ වෙතින් මෙය අසා දැන ගන්නා ලද්දේ යැ'යි යමෙක් පවසා ද එපමණකින් එය පිළිනොගන්න, ප්‍රතික්ෂේප ද නොකරන්න. එය එකවිට පිළිනොගෙන ප්‍රතික්ෂේප ද නොකොට එය සූත්‍රයන්ට බහා විනයට සසඳ බලන්න. එහි දී එය නොගැළපේ නම් නොපිළිගන්න. ගැළපේ නම් පමණක් ඒකාන්තයෙන් මෙය භාග්‍යවතුන් වහන්සේගේ වචනයක් ලෙස පිළිගන්න. මෙය පළමු මහාපදේශයයි.

2. යම් මහණෙක් 'තෙරුන් සහිත ගණපාමොක් මහණක් සහිත භික්ෂු සංඝයා අසවල් ආවාසයෙහි වෙසෙයි. 'මේ ධර්ම ය, මේ විනය ය, මේ ශාස්තෘ ශාසනය යැයි මම ඒ මහණුන් වෙතින් මෙය අසා දැන ගන්නා ලද්දේ යැ'යි යමෙක් පවසා ද එපමණකින් එය පිළිනොගන්න, ප්‍රතික්ෂේප ද නොකරන්න. එය එකවිට පිළිනොගෙන ප්‍රතික්ෂේප ද නොකොට එය සූත්‍රයන්ට බහා විනයට සසඳ බලන්න. එහි දී එය නොගැළපේ නම් නොපිළිගන්න. ගැළපේ නම් පමණක් ඒකාන්තයෙන් මෙය භාග්‍යවතුන් වහන්සේගේ වචනයක් ලෙස පිළිගන්න. මෙය දෙවන මහාපදේශයයි.

3. කිසියම් මහණෙක් 'අසවල් ආවාසයෙහි බොහෝ ඇසූ පිරූ තැන් ඇති ධර්ම විනය වාචෝද්ගත කළ බොහෝ ස්ථවිර භික්ෂූහු වෙති. මේ ධර්ම ය, මේ විනය ය, මේ ශාස්තෘ ශාසනය යැයි මම ඒ මහණුන් වෙතින් මෙය අසා දැන ගන්නා ලද්දේ යැ'යි යමෙක් පවසා ද එපමණකින් එය පිළිනොගන්න, ප්‍රතික්ෂේප ද නොකරන්න. එය එකවිට පිළිනොගෙන ප්‍රතික්ෂේප ද නොකොට එය සූත්‍රයන්ට බහා විනයට සසඳ බලන්න. එහි දී එය සූත්‍රවලට හා විනයට නොගැළපේ නම් නොපිළිගන්න. ගැළපේ නම් පමණක් ඒකාන්තයෙන් මෙය භාග්‍යවතුන් වහන්සේගේ වචනයක් ලෙස පිළිගන්න. මෙය තෙවන මහාපදේශයයි.

4. කිසියම් මහණෙක් 'අසවල් ආවාසයෙහි බොහෝ ඇසූ පිරූ තැන් ඇති ධර්ම විනය වාචෝද්ගත කළ එක් ස්ථවිර භික්ෂුවක් වෙසෙයි. මේ ධර්ම ය, මේ විනය ය, මේ ශාස්තෘ ශාසනය යැයි මම ඒ භික්ෂුව වෙතින් මෙය අසා දැන ගන්නා ලද්දේ යැ'යි යමෙක් පවසා ද එපමණකින් එය පිළිනොගන්න, ප්‍රතික්ෂේප ද නොකරන්න. එය එකවිට පිළිනොගෙන ප්‍රතික්ෂේප ද නොකොට එය සූත්‍රයන්ට බහා විනයට සසඳ බලන්න. එහි දී එය සූත්‍රවලට හා විනයට නොගැළපේ නම් නොපිළිගන්න. ගැළපේ නම් පමණක් ඒකාන්තයෙන් මෙය භාග්‍යවතුන් වහන්සේගේ වචනයක් ලෙස පිළිගන්න. මෙය සිව්වන මහාපදේශයයි.

බුදුරදුන් පිරිනිවී කල ධර්මවිනයට නොගැළපෙන දෑ ඊට ඇතුළුවීම වළක්වා නිර්මල බුද්ධවචනය බොහෝ කලක් දෙවියන් සහිත ලෝකයා අතර ප්‍රචලිත කරලන අදහසින් බුදුරජාණන් වහන්සේ මෙලෙස සතර මහාපදේශ දේශනා කරන්නට ඇත.

මේ අතර බුදුරජාණන් වහන්සේ පාවා නුවර වැඩ වෙසෙන බව දැනගත් **චුන්ද නම් කර්මාරපුත්‍රයා** උන් වහන්සේ බැහැ දැකීමට පැමිණ වැඳ නමස්කාර කොට ධර්මය අසා සතුටු ව හෙට දින දනට තම නිවසට වඩනා ලෙස ඇරයුම් කළේ ය. පසුදින දනට වැඩ බුදුරජාණන් වහන්සේට චුන්ද කර්මාරපුත්‍රයා සූකර මද්දව නම් දුර්ලභ හතුවර්ගයකින් සාදන ලද ඉතා වටිනා රසවත් ආහාරයක් බුදුරදුන්ට පිළිගැන්වූහ. එම දානය බුදුරදුන්ට පිළිගැන්වූ පසු ඉතිරි ආහාර කිසිවෙකුටත් නොදී වළදමන ලෙසට උන් වහන්සේ කරුණාවෙන් උපදෙස් දුන්හ. ඊට හේතුව තථාගතයන් වහන්සේ හැර ලොව අන් කිසිවෙකුට එම ආහාරය පත්තිය නොවන බැවිනි. අනතුරුව දහම් දෙසා දායක පිරිස සතුටු කරවා බුදුරජාණන් වහන්සේ හුනස්නෙන් නැගී ගියහ.

පසුව බුදුරදුන්ට **ලෝහිත පක්ඛන්දිකා** නම් දරුණු රෝගයක් පැන නැගුණු අතර භාග්‍යවතුන් වහන්සේ එය තම සිහිනුවණින් මැඩ පවත්වා අනඳ හිමියන් සමඟ කුසිනාරාව බලා පිටත් වූහ. එලෙස යන අතර මග බුදුරදුන්ට දැඩි පිපාසයක් ඇති වූ බැවින් අනඳ හිමියන් ලවා පැන්ගෙන්වා ගෙන වැළඳූහ. තවද අතර මගදී පුක්කුස මල්ල නම් පුත්‍රයෙක් බුදුරදුන් දැක පැහැදී සතුටු සාමීචි කථා කොට ගරුසරු දක්වා පිටත්ව ගියේ ය.

මේ අතර බුදුරජාණන් වහන්සේට සම්බුද්ධත්වය පත්වන අවස්ථාවෙහි පළමු දානය පිරිනැමූ සුජාතාවගේ කිරිපිඬු දානයත් අවසන් දානය පිළිගැන්වූ චුන්ද කර්මාරපුත්‍රයාගේ දානයත් මහත්ඵල ඇති දාන බව සඳහන් කරමින් විශේෂ අනුශාසනයක් සිදු කළහ (210 පි.).

මේ අතර අනඳ හිමියෝ බුදුරදුන්ගේ ශරීරයට කෙසේ අවසන් ගෞරව දැක්විය යුතුදැයි භාග්‍යවතුන් වහන්සේගෙන් විමසා සිටියහ. එවිට බුදුරදුන් ප්‍රකාශ කළේ ඊට උත්සාහ නොවන ලෙසත් තම ආධ්‍යාත්මික දියුණුව සඳහා කටයුතු බලා ගන්නා ලෙසත් ය. එහෙත් යළි යළිත් අනඳ හිමියන් ඒ ගැන විමසා සිටි විට බුදුරදුන් සඳහන් කළේ සක්විති රජකු ආදාහනය කරන අයුරින් බුදුසිරුර ආදාහනය කරන ලෙසයි. එය සිදු කරන ආකාරය ද සවිස්තරාත්මකව දැක්වූහ (220-222 පි.). මෙහි දී බුදුරජාණන් වහන්සේ **ථූපාරහ** (ස්තූප කොට පිදිය යුතු) පුද්ගලයන් හතර දෙනෙක් ගැන සඳහන් කළහ. එනම් සම්මා සම්බුදු රජාණන් වහන්සේ, පසේබුදුරජාණන් වහන්සේ, රහතන් වහන්සේ හා සක්විති රජ යන සිව්දෙනායි.

මෙලෙස කුසිනාරාවට වැඩම කළ බුදුරජාණන් වහන්සේ එහි සල්ගස් දෙකක් අතර අසුනෙහි වැඩ සිට සියලු සංස්කාරයන්ගේ අනිත්‍යතාව පළ කරමින් ක්‍රමයෙන් ධ්‍යානවලට සමවැද අවසන උතුම් පරිනිර්වාණයට පත් වූහ.

මේ අතර මහාකාශ්‍යප මහරහතන් වහන්සේ බුදුරදුන් මුණගැසීමට ඉතා දුරබැහැර සිට තම ශ්‍රාවකයන් සමඟ වැඩම කළ අතර උන් වහන්සේ පැමිණෙන තෙක් ශ්‍රී දේහයට ගිනි දැල්විය නොහැකි විය. මහාකාශ්‍යප මාහිමියන් බුදුසිරිපා වැඳීමත් සමඟ ශ්‍රී දේහය ඉබේ ම ගිනිගෙන දැල්වුණි. පසුව ධාතූන් වහන්සේලා මනුෂ්‍යයන් අතර මෙන් ම දෙව් බඹුන් අතර ද බෙදා ගැනුණි.

සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පමණ අතිදීර්ඝ කාලයක් ලෝ සතුන් වෙත අපමණ කරුණාවෙන් ඇස්, හිස්, මස්, ලේ යනාදී අපමණ දෑ පරිත්‍යාග කරමින් බුදුබව උදෙසා පාරමිතා පිරූ භාග්‍යවතුන් වහන්සේ මෙලෙස සම්බුද්ධත්වයට පත්ව වසර 45ක් බුද්ධ ජීවිතයක් ගත කොට 80 වියෙහි දී පිරිනිවන් පා වදාළ අතර මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රධාන මහරහතන් වහන්සේලා නිර්මල බුද්ධවචනය වසර දහස් ගණනක් පරපුරෙන් පරපුරට නොනැසී යන අයුරින් ස්ථාපිත කිරීමට අදාළ කටයුතු අප්‍රමාදීව සම්පාදනය කළහ. එහි ප්‍රතිඵල වශයෙන් අදත් ලොව මේ උතුම් දහම් කෝටි සංඛ්‍යාත මනුෂ්‍ය ජනතාවකට මෙන් ම අපමණ දෙව්බඹුන්ට යහපත සිදු කරමින් මේ දක්වා පවතී. මෙකල ජීවත් වන අප ද මේ උතුම් දහමින් අපගේ ජීවිත ආලෝකවත් කර ගනිමින් එය අනාගත පරපුරට දායාද කිරීමට අපගේ සියලු ශක්තීන් යෙදීමට අදිටන් කර ගනිමු.

ඔබ සැමට තෙරුවන් සරණයි !

සුභ වෙසක් මංගල්‍යයක් වේවා !

**{පැසදිනාහි ලොස් ඇන්ජලිස් බෞද්ධ විහාරස්ථානයෙහි වෙසක් සීල සමාදානය}**

**5/02/2015 - (බු.ව.2559)**